# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1950/10 – 2016 ජනවාරි 19 වැනි අඟහරුවාදා – 2016.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: සී.අයි. /1832.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 08, ගෝතමී පාර, පස්වන මහල, අංක 10හි පිහිටා ඇති රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම සහ අනෙක් පාර්ශ්වය වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9හි පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සංගමය අතර 2015 නොවැම්බර් මස 23 වැනි දින ඇතිකර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2016 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුව.

**2015 අංක 35 දරන සාමූහික ගිවිසුම**

කාර්මික ආරාවුල් පනතේ වගන්ති ප්‍රකාරව 2015 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම සාමූහික ගිවිසුම සමාගමක් ලෙස 1982 අංක 07 දරන සමාගම් ආඥාපනත යටතේ නියමිත පරිදි ස්ථාපිත කර ඇති සහ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ නියමිත පරිදි නැවත ලියාපදිංචි වී ඇති සිය ලියාපදිංචි කාර්යාලය අංක 10, පස්වන මහල, ගෝතමී පාර, කොළඹ 08 යන ලිපිනයේ පිහිටි රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම එක් පාර්ශ්වයකුත් (මින් පසු සේවායෝජක වශයෙන් හඳුන්වනු ලබන) හා වෘත්තිය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති සිය ලියාපදිංචි කාර්යාලය තලංගම කොස්වත්ත, සෙත්සිරි මාවතේ අංක 259/9 යන ස්ථානයේ පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (මින් පසු සමිතිය වශයෙන් හඳුන්වනු ලබන) අනෙකුත් පාර්ශ්වයන් වශයෙන් එම පාර්ශ්වයන් අතර, වර්ෂ 2015 ජුනි මස 01 වැනි දින ගිවිස ගන්නා ලදී.

**පාර්ශ්වයන් විසින් එකඟතාවයට පැමිණි කරුණු පහත පරිදි වේ.**



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම සාමූහික ගිවිසුම ''රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම - සාමූහික ගිවිසුම'' වශයෙන් හඳුන්වනු ලැබේ.

1. **ආවරණය වන හා බැඳෙන සේවකයන්.–**

විධායක ශ්‍රේණිවල හැර මෙම ගිවිසුම අත්සන් කරන දිනට සේවායෝජකයාගේ සේවා නියුක්තියේ යෙදී සිටින සියළුම ස්ථිර සේවකයින් මෙම ගිවිසුමෙන් ආවරණය වී බැඳී සිටී.

2. **ක්‍රියාත්මක වන දිනය සහ කාල සීමාව.–**

මෙම ගිවිසුම 2015 ජූනි මස 01 වන දින සිට බලපැවැත්වෙන අතර, එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට මාස 06 ක ලිඛිත පූර්ව දැන්වීමක් ලබා දීමෙන් අනතුරුව අවසන් කරන තෙක් එය ක්‍රියාත්මක විය යුතු වන අතර, යම් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත 2017 මැයි මස 31 වන දිනට පෙර එසේ දැනුම් දීමක් නොදිය යුතු වන අතර, එවැනි දැනුම් දීමක් කිසිසේත් වලංගු නොවන අතර මෙම ගිවිසුම 2017 මැයි මස 31 වන තෙක් අවසන් නොවනු ඇත. 2017 මැයි මස 31 වන දිනට පෙර නිකුත් කරනු ලබන වෙනත් කිසිඳු පූර්ව දැන්වීමක් කිසිසේත් බලනොපැවැත්වෙනු ඇත.

3. *වැටුප් වැඩිවීම.–*

2015 ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ අවම වැටුප රු. 15,000/-ට ගෙන එන ලදී. එසේ ගෙන ඒමේදී රු. 15,000/- වැටුපට අඩුවෙන් සිටි සමහර ස්ථිර සේවක මහත්ම මහත්මීන්ට විවිධ ආකාරයෙන් වැටුප් වැඩිවීමක් ලැබී ඇත.

4. එසේ හෙයින් පහත සඳහන් කරන ලද වැටුප් වැඩිවීම සහ පහත වැටුප් වැඩිවීම සසඳා බලා එම මූල්‍යමය ගණන් කිරීම් දෙකේ අතර වෙනසක් තිබුණොත් පමණක් එම වෙනස වැටුපට එකතු කරනු ලැබේ. වෙනසක් නොවේ නම් කිසිම වැටුප් වැඩිවීමක් එකී සේවකයින්ට හිමි නොවේ.

5. 2015 ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ගිවිසුමෙන් ආවරණය වන සියළුම ස්ථිර සේවකයින් සඳහා පහත සඳහන් පරිදි වැටුප් වැඩිවීමක් සිදුවනු ඇත. මෙම වැටුප් වැඩිවීම පුහුණුවන්නන්ට අදාළ නොවේ.

වසර 01 සිට වසර 05 දක්වා වසරකට රු. 200/- බැගින් රු. 1000/-ක උපරිමයක් ද,
වසර 05 සිට වසර 10 දක්වා වසරකට රු. 250/- බැගින් රු. 1250/-ක උපරිමයක් ද,
වසර 10 සිට වසර 15 දක්වා වසරකට රු. 300/- බැගින් රු. 1500/-ක උපරිමයක් ද,
වසර 15 සිට වසර 19 දක්වා වසරකට රු. 350/- බැගින් රු. 1400/-ක උපරිමයක් ද, වශයෙන් වැටුප් වැඩිවීම සිදුවනු ඇත.

6. ඉහත වැටුප් වැඩිවීමට අමතරව මෙකී සාමූහික ගිවිසුමට ඇමුණුමක් වශයෙන් සඳහන් කර ඇති සේවා කාලය වසර 06 සිට වසර 14 දක්වා සිටින සේවකයින් 44 දෙනෙකුගේ වැටුප තවමත් රු. 15,000/- මට්ටමේ තිබෙන බැවින් ඔවුන්ට පමණක් විශේෂිතව පහත සඳහන් ආකාරයට වැටුප් වැඩිවීමක් ලබාදී එකී වැටුප් තලයේ තබනු ඇත. මෙම වැටුප් වැඩිවීම ද 2015 ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

වසර 06ක සේවා කාලය රු. 15100/-
වසර 07ක සේවා කාලය රු. 15150/-
වසර 08ක සේවා කාලය රු. 15200/-
වසර 09ක සේවා කාලය රු. 15250/-
වසර 10ක සේවා කාලය රු. 15300/-
වසර 11ක සේවා කාලය රු. 15350/-
වසර 12ක සේවා කාලය රු. 15400/-
වසර 13ක සේවා කාලය රු. 15450/-
වසර 14ක සේවා කාලය රු. 15500/-

7. ඉහත සියලු වැටුප් සංශෝධනයන්හි දී මෙම වැටුප් තලවලට පැමිණ සිටින සේවක මහත්ම මහත්මීන් 44 දෙනාගේ වැටුප් නැවත සංශෝධනයක් කළමණාකාරීත්වය තීරණය කරන පරිදි මෙම සාමූහික ගිවිසුම වලංගු දින සිට වසර 01ට නොඅඩු සහ වසර එකහමාරකට නොවැඩි කාලසීමාවක් තුළදී සිදුකරනු ලැබේ.

8. පඩිපාලක සභාවේ නිගමනයන්ට අනුව සියලු සේවකයන් ශ්‍රේණිගත කිරීම කරනු ඇත.

9. කළමණාකාරීත්වය තීරණය කරන පරිදි වර්ෂයක් තුළදී තමන්ට හිමි නිවාඩු දින 07ක් හෝ 07ට අඩුවෙන් නිවාඩු ලබාගන්නා සේවක මහත්ම මහත්මීන්ට පමණක් දැනට ප්‍රසාද ගෙවීමක් වශයෙන් ගෙවනු ලබන මාසික මූලික වැටුපට සමාන මුදලක් ඊළඟ වර්ෂයේ ජනවාරි මස ගෙවනු ලැබේ.

10. කළමණාකාරීත්වය තීරණය කරන පරිදි සියලුම සේවකයින් සඳහා ප්‍රසාද දීමනාවක් ලෙස රු. 3000/-ට නොඅඩු මුදලක් ද, එම මුදල ලාභාංශ මත රු. 5000/- දක්වා උපරිමයකට යටත්ව පෙර වසරවල ගෙවූ ක්‍රමවේදය අනුව ජනවාරි මස ගෙවීමට කටයුතු කරනු ලැබේ.

11. මීට අමතරව වෙනත් කිසිඳු ආකාරයක මූල්‍යමය වැඩිවීමක් මෙම ගිවිසුමේ කාලසීමාව තුළ සිදුනොවන බවට පාර්ශ්වයන් එකඟ වේ.

12. ආයතනයේ නිෂ්පාදනය ඉහළ දැමීමට වෘත්තීය සමිති හා කළමණාකාරීත්වය සහයෝගයෙන් කටයුතු කිරීමටත් වෘත්තීය සමිති හා එහි සාමාජිකයන් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග සහ වැඩසටහන්වලට පූර්ණ සහයෝගය දැක්වීමටත් එකඟ වේ.

13. මෙම ගිවිසුම ක්‍රියාත්මක වන කාලය තුළ දී මෙහි අන්තර්ගත වන කිසිදු කරුණක් වෙනස් කිරීමට කිසිදු පාර්ශ්වයක් විසින් උත්සාහ නොකළ යුතු ය.

14. **ආරවුල් විසඳීමේ ක්‍රමවේදය.**–
ආයතනය තුළ කිනම් ආකාරයක හෝ ආරාවුලක් මතු වූ අවස්ථාවක දී පහත සඳහන් ආරාවුල් විසඳීමේ ක්‍රමවේදය අනුව කටයුතු කිරීමට දෙපාර්ශ්වය බැඳී සිටී.

(අ) ආරාවුලක් සම්බන්ධයෙන් වූ කාරණාවක දී එම කාරණාව සම්බන්ධව සමථයකට එළඹීම සඳහා පළමුව, ආයතනික මට්ටමින් පාලනාධිකාරිය හා වෘත්තීය සමිති නියෝජිතයින් අතර සාකච්ඡා කළ යුතුයි.

(ආ) එසේ ආරාවුල සමථයකට පත් කිරීමට නොහැකි වූයේ නම්, ආරාවුල සම්බන්ධයෙන් විසඳුමකට පැමිණීම සඳහා ශ්‍රී ලංකා සේව්‍ය සංගමය සමග සාකච්ඡාවක් වෙත යා යුතුය.

(ඇ) එසේ ආරාවුල සමථයකට පත් නොවන්නේ නම් අදාළ කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කර සමථ කරන පිළිවෙත් අනුගමනය කළ යුතු වේ.

(ඈ) යම් ආරාවුලක් ඇති වූ අවස්ථාවන් හි දී ඉහත ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමට වෘත්තීය සමිති එකඟ වන අතර, ආරාවුල සමථයකට පත් නොවූ අවස්ථාවක දී දින දාහතරක (14) පැහැදිලි දැනුම් දීමකින් අනතුරුව වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට යොමු වීමට වෘත්තීය සමිතිවලට ඉඩකඩ ඇත.

සේවායෝජක පාර්ශවය වෙනුවෙන්,
රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම

.................................

එම්.මුදිත ප්‍රනාන්දු

සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

Royal Fernwood Porcelain Limited
Police Station Road
Kosgama.

වෘත්තිය සමිති පාර්ශවය වෙනුවෙන්.
අන්තර් සමාගම් සේවක සංගමය

.................................

ඩබ්.ජ්.සෝමදාස

ජ්‍යෙෂ්ඨ උප සභාපති

සාක්ෂිකරු

2015/11/23
.................................

ජ්.පී.ප්‍රියංගනී පියසේන

මානව සම්පත් කළමණාකාරිනි

සාක්ෂිකරු

2015/11/23
.................................

පී.කේ.පියල් දේශප්‍රිය

සභාපති

02 - 81